# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/40 – 2018 ජුනි 29 වැනි සිකුරාදා – 2018.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/02/2016/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ඩබ්. එන්. පෙරේරා මයා, පන්සල අසල, අඩිප්පල.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජුනි මස 25 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය:* IR/COM/02/2016/182.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ඩබ්. එන්. පෙරේරා මයා, පන්සල අසල, අඩිප්පල.

*සහ*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක 15, රොක්හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කරන කේ. ඩබ්. එන්. පෙරේරා මයාට, 2014.01.01 දිනට හිමි උසස්වීම් ලබානොදීම තුලින් ද, 2015.06.25 වැනි දින රාජකාරියට වාර්තා කරමින් සිටියදී සිදුවූ අනතුර සඳහා හදිසි අනතුරු නිවාඩු අනුමත නොකිරීම මගින් ඔහුට හිමි නිවාඩු වලින් දින 22ක් කපා හැරීම මගින්ද, ඉතිරි නිවාඩු 57ක් වැටුප් රහිත නිවාඩු සේ සලකා වැටුපෙන් අය කිරීමෙන්ද, වාර්ෂික වැටුප් වර්ධක අත්හිටුවීම මගින් ද එම සේවක මහතාට අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 431

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.